# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2017 නොවැම්බර් මස 02 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2017.11.07 දින නිකුත් කරන ලදී)**


## භාර (සංශෝධන)

**(87 වන අධිකාරය වූ) භාර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 18.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය.

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතේ 3 වන වගන්තියට "අර්ථලාභියා" සහ "නියම කරනු ලබන" යන යෙදුම්වල අර්ථ දැක්වීම් ඇතුළත් කිරීම මගින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 6අ සහ 6ආ යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර-

(අ) 6අ අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් භාර පිළිබඳ රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු වන බවට විධිවිධාන සැලැස්වීම හා භාර සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් තොරතුරු සපයන ලෙස භාරකරුවන්ට නියම කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ; සහ

(ආ) 6ආ අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ අදාළ අධිකාරීන් වෙත භාර පිළිබඳ තොරතුරු සැපයීමට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට හැකි වන පරිදි විධිවිධාන සැලැස්වීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 19අ, 19ආ සහ 19ඇ යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර-

(අ) 19අ අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ භාරවලට සම්බන්ධ තැනැත්තන්ගේ අනන්‍යතාව පිළිබඳව යාවත්කාලීන තොරතුරු පිළිබඳ වාර්තා තබාගන්නා ලෙස භාරකරුවන්ට නියම කිරීම වේ;

(ආ) 19ආ අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ අදාළ අධිකාරීන් වෙත තොරතුරු සපයන ලෙස භාරකරුවන් වෙත නියම කිරීම වේ; සහ

(ඇ) 19ඇ අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ, 19, 19අ සහ 19ආ යන වගන්ති යටතේ සිදු කරනු ලබන වැරදි සඳහා දණ්ඩන පැනවීම වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියට 19ඇ වගන්තිය ඇතුළත් කිරීම මගින් කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියට 19ඇ වගන්තිය ඇතුළත් කිරීම මගින් කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***7 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 115අ අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ අමාත්‍යවරයා විසින් නියෝග සෑදීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

## භාර (සංශෝධන)

එල්.ඩී.-ඕ. 24/2016

**(87 වන අධිකාරය වූ) භාර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2017 අංක      දරන භාර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

87 වන අධිකාරයේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතේ 3 වන වගන්තියේ (ඉ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඉ) "අර්ථලාභියා" යන්නෙන්, විශ්වාසය පිළිගන්නා ලද්දේ යම් තැනැත්තකුගේ අර්ථලාභය පිණිස ද නැතහොත් අර්ථ දක්වන ලද හෝ ස්ථිර වශයෙන් නිශ්චය කරනු ලැබිය හැකි තැනැත්තන් පන්තියක අර්ථලාභය පිණිස ද, ඒ තැනැත්තා හෝ ඒ තැනැත්තන් පන්තිය අදහස් වේ;

(ඉඉ) "නියම කරනු ලබන" යන්නෙන්, මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් නියම කරනු ලැබීම අදහස් වේ;".

ප්‍රධාන ප්‍රඥප්තියට 6අ සහ 6ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 6අ සහ 6ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු යː-

"රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් භාර පිළිබඳ රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු බව.

6අ. (1) 5 වන වගන්තියට අනුකූලව ඇති කරන ලද සෑම භාරයක් පිළිබඳව ම නියම කරනු ලැබිය හැකි තොරතුරු ඇතුළත් රෙජිස්ටරයක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පිළියෙල කර පවත්වාගෙන යා යුතු ය.

2—PL 010391—475 (2017/10)

(2) යම් නිශ්චල දේපළක හෝ චංචල දේපළක භාරකරු විසින් (1) වන උපවගන්තියේ කාර්ය සඳහා භාරයට අදාළ නියම කරනු ලැබිය හැකි සියලු තොරතුරු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

භාර පිළිබඳ තොරතුරු සැපයීම රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ යුතුකම වන බව.

6ආ. (1) මූල්‍ය බුද්ධි ඒකකය විසින් හෝ මූල්‍ය බුද්ධි ඒකකයේ ලිඛිත අවසරය ඇතිව වෙනත් යම් අධිකාරියක් විසින් කරනු ලබන ඉල්ලීමක් මත, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින්, 6අ වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන රෙජිස්ටරයේ සඳහන් යම් භාරයකට අදාළ යම් තොරතුරක් මූල්‍ය බුද්ධි ඒකකය හෝ ඒ වෙනත් යම් අධිකාරිය වෙත සැපයිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා මූල්‍ය බුද්ධි ඒකකය යනු 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ නම් කරනු ලැබිය හැකි මූල්‍ය බුද්ධි ඒකකය වන්නේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 19අ, 19ආ සහ 19ඇ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ඒ ප්‍රඥප්තියේ 19අ, 19ආ සහ 19ඇ වගන්ති ලෙස බලාත්මක විය යුතු යඃ-

“අනන්‍යතාව පිළිබඳ යාවත්කාලීන තොරතුරු භාරකරු විසින් තබාගත යුතු බව.

19අ. (1) භාරකරුවකු විසින්, 6 වන වගන්තිය යටතේ භාරය ඇති කරන අවස්ථාවේ දී පහත සඳහන් තැනැත්තන්ගේ අනන්‍යතාව පිළිබඳව නියම කරනු ලැබිය හැකි සියලු තොරතුරු පිළිබඳ වාර්තා තබා ගත යුතු යඃ-

(අ) භාරකරු වන තමා පිළිබඳව;

(ආ) සම භාරකරුවන් සිටී නම් ඒ භාරකරුවන් පිළිබඳව;

(ඇ) භාරයේ කර්තෘ පිළිබඳව;

(ඈ) හැකි උපරිම ප්‍රමාණයෙන් අර්ථලාභියා පිළිබඳව; සහ

(ඉ) අනුයෝජිතයකු, නෛතික නියෝජිතයකු, කළමනාකරුවකු, ආයෝජන උපදේශකවරයකු හෝ බදු උපදේශකවරයකු, ගණකාධිකාරීවරයකු හෝ අන්‍යාකාරයෙන් භාරය ක්‍රියාත්මක කිරීමේ නිරතව සිටින වෙනත් යම් තැනැත්තකු පිළිබඳව.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ තොරතුරු සෑම මාස තුනකට ම වරක් හැකි උපරිම ප්‍රමාණයෙන් සත්‍යායනය කර යාවත්කාලීන කළ යුතු ය.

(3) තැනැත්තන් පන්තියක අර්ථලාභය පිණිස භාරයක් ඇති කර ඇති අවස්ථාවක, ඒ තැනැත්තන් පන්තියට අයත් සෑම තැනැත්තකුගේ ම අනන්‍යතාව පිළිබඳව නියම කරනු ලැබිය හැකි සියලු තොරතුරු හැකි උපරිම ප්‍රමාණයෙන් (1) වන උපවගන්තිය යටතේ වාර්තාගත කර තබාගත යුතු ය.

(4) ස්වාභාවික තැනැත්තකු නොවන තැනැත්තකුගේ අර්ථලාභය පිණිස භාරයක් ඇති කර ඇති අවස්ථාවක, එම භාරයේ අර්ථලාභී හිමිකරු වන්නා වූ ස්වාභාවික තැනැත්තාගේ අනන්‍යතාව පිළිබඳ තොරතුරු (1) වන උපවගන්තිය යටතේ වාර්තාගත කර තබාගත යුතු ය.

(5) (1) වන, (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල සඳහන් යම් තැනැත්තකු හා සම්බන්ධ තොරතුරු පිළිබඳ වාර්තා, ඒ තැනැත්තා භාරය සමග සම්බන්ධව සිටීම නතර වන දින සිට අවම වශයෙන් අවුරුදු හයක කාලසීමාවක් දක්වා භාරකරුවකු විසින් පවත්වාගෙන යා යුතු ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා "අර්ථලාභී හිමිකරු" යන්නෙන්, භාරයේ ප්‍රතිලාභවල අත්‍යන්ත හිමිකාරත්වය ඇති හෝ භාර දේපළ පාලනය කරන ස්වාභාවික තැනැත්තා හෝ තැනැත්තන්, නැතහොත් භාරය ඇති කරනු ලබන්නේ යම් තැනැත්තකු හෝ තැනැත්තන් වෙනුවෙන් ද ඒ තැනැත්තා හෝ තැනැත්තන් අදහස් වන අතර, ඊට යම් තැනැත්තකු

කෙරෙහි හෝ සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක් කෙරෙහි, සක්‍රීය ලෙස අත්‍යන්ත පාලනයක් පවත්වා ගෙන යන්නා වූ තැනැත්තා හෝ තැනැත්තන් ද ඇතුළත් වේ.

අනන්‍යතාව පිළිබඳ යාවත්කාලීන තොරතුරු භාරකරු විසින් අදාළ අධිකාරීන් වෙත සැපයිය යුතු බව.

19ආ. (1) (අ) 19අ වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන වාර්තාවේ ඇති, ඒ වගන්තියේ සඳහන් යම් තැනැත්තකු පිළිබඳව වන යම් තොරතුරක් සපයන ලෙස යම් අදාළ අධිකාරියක් විසින් භාරකරුවකුට සහ සම භාරකරුවකු සිටී නම්, ඒ සම භාරකරුට නියම කරනු ලබන කවර හෝ අවස්ථාවක දී, ඒ භාරකරු විසින් ඒ තොරතුරු ඒ අදාළ අධිකාරිය වෙත සැපයිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ කාර්යය සඳහා "අදාළ අධිකාරිය" යන්නෙන් -

(i) මුදල් විශුද්ධිකරණය වැළැක්වීම පිළිබඳ වගකීම සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ වගකීම පැවරී ඇති යම් රජයේ අධිකාරියක්; හෝ

(ii) මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම ආශ්‍රිත වැරදි විමර්ශනය කිරීමේ සහ ඒ සම්බන්ධයෙන් නඩු පැවරීමේ කර්තව්‍ය ඉටු කරන සහ එම වැරදිවලට අදාළ වත්කම් තහනමට ගැනීමේ හෝ ක්‍රියාවිරහිත කිරීමේ සහ රාජසන්තක කිරීමේ කර්තව්‍ය ඉටු කරන යම් අධිකාරියක්,

අදහස් වේ.

(2) (අ) යම් භාරකරුවකු විසින් මූල්‍ය ව්‍යාපාර කටයුතු හෝ නාමෝද්දිෂ්ට මූල්‍යමය නොවන ව්‍යාපාර කටයුතු සිදු කරන යම් ආයතනයක් සමග, නියම කරනු ලැබිය හැකි මූල්‍යමය සීමාවක් ඉක්මවා යමින් අඛණ්ඩ ව්‍යාපාරික සම්බන්ධතාවක් ඇතිකර ගන්නා විට හෝ යම් ගනුදෙනුවක් සිදු කරනු ලබන විට

හෝ වරින් වර සිදුවන ගනුදෙනුවක් සිදු කරන විට, එම ආයතනය විසින් නියම කරනු ලබන පරිදි, 19අ වගන්තියේ සඳහන් යම් තැනැත්තකුගේ අනන්‍යතාව පිළිබඳව හෝ එම ව්‍යාපාරික සම්බන්ධතාවට විෂය වන භාර දේපළ පිළිබඳව යාවත්කාලීන තොරතුරු එම භාරකරු විසින් ලබා දිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ කාර්යය සඳහා "නාමෝද්දිෂ්ට මූල්‍යමය නොවන ව්‍යාපාරය", "මූල්‍ය ව්‍යාපාරය" සහ "වරින් වර සිදුවන ගනුදෙනුව" යන යෙදුම්වලට 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ඇති අර්ථයන් ම තිබිය යුතු ය.

6අ, 19, 19අ සහ 19ආ වගන්ති උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වූ දණ්ඩනය.

19ඇ. 6අ, 19, 19අ සහ 19ආ වගන්තිවල විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කරන භාරකරුවකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම එම භාරකරු යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තියේ "ඔහු ධුරයෙන් නිදහස් කිරීමෙන්" යන වචන වෙනුවට, "ඔහු ධුරයෙන් නිදහස් කිරීමෙන් හෝ එම භාරකරු 19ඇ වගන්තිය යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබීමෙන්" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 75 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "අනනුකූල භාරයක් පිළිගනු ලබන" යන වචන වෙනුවට, "අනනුකූල භාරයක් පිළිගනු ලබන හෝ 19ඇ වගන්තිය යටතේ වූ වරදකට වරදකරු කරනු ලබන" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 115අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය එම ප්‍රඥප්තියේ 115අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු යː-

"නියෝග.

115අ. (1) මේ පනත මගින් නියෝග සෑදීමට නියම කර ඇති සියලු කරුණු සම්බන්ධයෙන් හෝ මේ පනත මගින් නියෝග සෑදීමට බලය පවරා ඇති සියලු කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, එම නියෝග එසේ පළ කරනු ලබන දිනයේ දී හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම හැකිතාක් ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලබන සෑම නියෝගයක් ම, එය යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.".

**8.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.